# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

---

## ජනකරලිය සංස්කෘතික පදනම (සංස්ථාගත කිරීමේ)

**ජනකරලිය සංස්කෘතික පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි.**

---

පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා විසින්
2016 ජුනි මස 07 වන දින ඉදිරිපත් කරන ලදී.

(ගැසට් පත්‍රයේ පළ කළේ 2016 මැයි මස 16 වන දින)

මුද්‍රණය කිරීමට පාර්ලිමේන්තුව විසින් නියෝග කරන ලදී.

---

[111 වන පනත් කෙටුම්පත]

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

**මිළ : රු. 8.00 යි.** **තැපැල් ගාස්තුව : රු. 10.00 යි.**

2—PL 009987—225 (2016/06)

# ජනකරලිය සංස්කෘතික පදනම (සංස්ථාගත කිරීමේ)

## ජනකරලිය සංස්කෘතික පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි.

පූර්විකාව.

''ජනකරලිය සංස්කෘතික පදනම'' යනුවෙන් සඳහන් කරනු ලබන පදනමක්, එකී පදනමේ සාමාජිකයන් එකඟ වූ රීති අනුව, ඒ පදනමේ, පරමාර්ථ හා ඊට අදාළ කාරණා ඵලදායී ලෙස ක්‍රියාවේ යෙදවීමේ කාර්යය සඳහා මෙතෙක් කල් පිහිටුවා තිබූ හෙයින් ද :

එකී පදනම පිහිටුවනු ලැබුවේ යම් පරමාර්ථ සහ කරුණු සඳහා ද, ඒ පරමාර්ථ හා කාරණා මෙතෙක් කල් එකී පදනම විසින් සාර්ථකව ක්‍රියාත්මක කර සහ ඉටු කර ඇති හෙයින් සහ එකී පදනම සංස්ථාගත කරන ලෙස ඉල්ලා ඇති හෙයින් ද, ඒ ඉල්ලීම ඉෂ්ට කිරීම මහජන යහපත පිණිස වන හෙයින් ද:

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

ලුහුඬු නාමය.

**1.** මේ පනත 2016 අංක     දරන ජනකරලිය සංස්කෘතික පදනම (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

ජනකරලිය සංස්කෘතික පදනම සංස්ථාගත කිරීම.

**2.** මෙම පනත ක්‍රියාත්මකවීම ආරම්භ වන දින සිට සහ ඉන් පසු (මෙහි මින් මතු ''පදනම'' යනුවෙන් සඳහන් කරනු ලබන) ජනකරලිය සංස්කෘතික පදනමේ දැනට සාමාජිකයන්ව සිටින තාක් තැනැත්තන් මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාවට මින්මතු බඳවාගනු ලබන තැනැත්තන් (මෙහි මින් මතු ''සංස්ථාව'' යනුවෙන් සඳහන් කරනු ලබන) ''ජනකරලිය සංස්කෘතික පදනම'' යන නාමය සහ අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති සංස්ථාවක් විය යුතු ය. තව ද ඒ නාමයෙන් ඒ සංස්ථාව විසින් ද එයට විරුද්ධවද නඩු පවරනු ලැබිය හැකි අතර, පොදු මුද්‍රාවක් තබාගැනීමේ, එය පාවිච්චි කිරීමේ ද, ස්වකීය අභිමතය පරිදි එය වෙනස් කිරීමේද සම්පූර්ණ බලය හා අධිකාරය ඒ සංස්ථාවට ඇත්තේ ය.

සංස්ථාවේ පොදු පරමාර්ථ.

**3.** සංස්ථාව සංස්ථාපනය කරනු ලබන්නේ යම් පොදු පරමාර්ථ සඳහා ද ඒ පොදු පරමාර්ථ පහත සඳහන් පරිදි විය යුතු යයි මෙයින් ප්‍රකාශ කරනු ලැබේ:—

2—PL 009887 -300 (2016/04)

(අ) භෞතික සංවර්ධනයට සමාන්තරව පවත්වා ගතයුතු සංස්කෘතික සහ ආත්මික සංවර්ධනයේ වැදගත්කමත්, එවැනි අනුකලණීය සංවර්ධනය ක්‍රියාවලියක් තුළ නාට්‍ය හා රංගකලාව සහ අනෙකුත් කලාවන් සහයෝගී මානව ක්‍රියාකාරකම් ලෙස උපයෝගී කරගැනීමේ වටිනාකමත්, එමගින් සංවේදී, කුසලතාපූර්ණ සහ ප්‍රඥාසම්පන්න සමාජයක් ගොඩනැගීමේ හැකියාවත් පිළිබඳව සමාජයේ සියළු ස්ථරවල ජනතාව දැනුවත් කිරීම;

(ආ) වාර්ගික, සමාජ, සංස්කෘතික හෝ දේශපාලනික භේදයකින් තොරව රටේ බහුතර ජනතාවට නාට්‍ය දර්ශන පැවැත්වීමේ රංග කලාවට සහභාගි වීමට හැකි වන අවකාශයන් පුළුල් කිරීම සහ විවිධ ක්‍රමවේද මගින් ඔවුන් නාට්‍ය හා රංගකලාව සහ අනෙකුත් කලාවන් ඇසුරු කිරීම සඳහා යොමු කිරීම ;

(ඇ) සමාජයේ බහුතර ජනතාවගේ ආත්ම සම්මානය වර්ධනය කරන අතරම, අන්‍යයින් හා යහපත් ලෙස හා එළදායී ලෙස අදහස් හුවමාරු කර ගැනීමට හා සම්බන්ධතා පැවැත්වීමට හැකිවන පරිදි අන්‍යයින් තේරුම් ගැනීම, ඉවසීම, අගය කිරීම සහ ඔවුන්ගේ අයිතීන්ට ගරු කිරීම, සහ විවිධ මතවාදයන් සහ සංස්කෘතීන්, හැසිරීම් රටාවන් තේරුම් ගැනීම යනා දී ගුණාංගයන්ගේ ප්‍රතිඵලයක් ලෙස සියල්ලන්ටම සහජීවනයෙන් හා සාමයෙන් ජීවත් වියහැකි සමාජයක් ගොඩනැගීමට හේතුවන පරිදි නාට්‍ය හා රංග කලාව සහ අනෙකුත් කලාවන් භාවිතා කිරීම සහ ඊට සහාය වීම;

(ඈ) ස්වභාව ධර්මය සහ සහජීවනයෙන් ජීවත් වියහැකි පරිදි ස්වභාව ධර්මය වටහාගැනීමටත් ස්වභාව ධර්මය සමඟ යහපත් සම්බන්ධතාවක් ගොඩනගා ගැනීමටත් හැකි වන සමාජයක් නිර්මාණය කිරීමට සහාය වීම ;

(ඉ) අධ්‍යාපනික විෂයයන් ලෙස නාට්‍ය හා රංගකලාව සහ ඊට සම්බන්ධ ආනුෂංගික කලාවන් පිළිබඳ පොත්, රංග පත්‍රිකා, අත්පත්‍රිකා, ප්‍රවෘත්ති පත්‍ර, සඟරා, වාර සඟරා ප්‍රවෘත්ති නිවේදන, විවරණිකා සහ ශ්‍රව්‍ය දෘෂ්‍ය ද්‍රව්‍ය සකස් කිරීම, මුද්‍රණය කිරීම, ප්‍රකාශනය කිරීම, සංස්කරණය කිරීම

හා සංසරණය කිරීම මගින් ඒ පිළිබඳ තොරතුරු හා දැනුම ව්‍යාප්ත කිරීම සහ එම අවශ්‍යතාවම වෙනුවෙන් ශ්‍රව්‍ය දෘෂ්‍ය මාධ්‍ය භාවිතා කිරීම;

(ඊ) ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක හෝ ශ්‍රී ලංකාවෙන් පිටත, නාට්‍ය හා රංගකලාව පිළිබඳ වැඩමුළු, සම්මන්ත්‍රණ, සංවාද, කණ්ඩායම් අධ්‍යයන සහ පොදු දේශණ පැවැත්වීම හෝ සහ ඒවාට අනුග්‍රහ දැක්වීම;

(උ) පදනමේ අරමුණු ඉෂ්ඨ කර ගැනීම සඳහා පුද්ගලයින්ට, ප්‍රජා මූල සංවිධානවලට සහ රාජ්‍ය ආයතනවලට සහය දැක්වීම හෝ සම්බන්ධව කටයුතු කිරීම.

සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම.

**4.** (1) සංස්ථාවේ කටයුතු මේ පනතේ අනෙකුත් විධිවිධානවලට සහ 6 වන වගන්තිය යටතේ සාදනු ලබන සංස්ථාවේ රීතිවලට යටත්ව සහ එම රීතිවලට අනුකූලව තෝරා පත්කර ගනු ලබන සභාපති, ලේකම්, භාණ්ඩාගාරික ඇතුළු පස් දෙනකුගෙන් සමන්විත අධ්‍යක්ෂ මණ්ඩලයක් මගින් කළමනාකරණය කරනු ලැබිය යුතු ය.

(2) සංස්ථාවේ ප්‍රථම අධ්‍යක්ෂ මණ්ඩලය මේ පනත ක්‍රියාත්මක වන දිනට පෙරාතුවම වූ දිනයේ දී පදනමේ පාලක මණ්ඩලයේ සාමාජිකත්වය දැරුවා වූ තැනැත්තන්ගෙන් සමන්විත විය යුතු ය.

(3) අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයකු මියයාම හෝ ඉල්ලා අස්වීම නිසා කලින් ධුරය අත්හළහොත් මිස, ඔහුගේ තෝරා පත් වීමේ දින සිට අවුරුදු හතරක කාලයක් සඳහා ධුරය දැරිය යුතු ය.

(4) අධ්‍යක්ෂ මණ්ඩලයේ යම් සාමාජිකයකු ඔහුගේ ධුර කාලය අවසන්වීමට පෙර තම ධුරය හිස් කළහොත්, සංස්ථාවේ රීතිවලට අනකූලව තෝරාපත් කරගනු ලබන ඔහුගේ අනුප්‍රාප්තිකයා ධුර දැරිය යුත්තේ ඔහු විසින් අනුප්‍රාප්ත කරනු ලබන සාමාජිකයාගේ නොගෙවුනු ධුර කාලය සඳහා පමණක් වන්නේ ය.

සංස්ථාවේ සාමාන්‍ය බලතල.

**5.** නිශ්චල හෝ චංචල දේපළ අත්කර ගැනීම හෝ දැරීම,බැංකු ගිණුම් විවෘත කිරීමේ, පවත්වාගෙන යාමේ හා වැසීමේ ද ඇප ඇතිව හෝ නැතිව මුදල් ණයට ගැනීමේ හෝ ලබා ගැනීමේ ද, ප්‍රදානයන් සහ පරිත්‍යාග භාර ගැනීමේ සහ එකතු කිරීමේ ද, සංස්ථාවේ මුදල් ආයෝජනය කිරීමේ ද, සංස්ථාව විසින් දරනු ලබන යම් ඉඩමක ගොඩනැගිලි හෝ ව්‍යුහයන් ඉදිකිරීම, සංස්ථාවේ පරමාර්ථ ඉටු කර ගැනීම සඳහා අවශ්‍ය නිලධරයන් සහ සේවකයන් සේවයට බඳවා ගැනීමේ, සේවයේ නියුක්ත කිරීමේ, සේවයෙන් පහ කිරීමේ ද බලය ඇතුළුව, සංස්ථාවේ සියලුම පරමාර්ථ හෝ එහි යම් පරමාර්ථයක් ප්‍රවර්ධනය කිරීම හෝ සාක්ෂාත් කර ගැනීම සඳහා අවශ්‍ය හෝ යෝග්‍ය සියලු ක්‍රියා, කරුණු හෝ දේවල් කිරීමේ, ඉටු කිරීමේ සහ ක්‍රියාවේ යෙදවීමේ බලය මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව සංස්ථාවට ඇත්තේ ය.

සංස්ථාවේ රීති.

**6.** (1) සංස්ථාව විසින් කලින් කල යම් මහා සභා රැස්වීමක දී ඊට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගෙන් තුනෙන් දෙකකට නොඅඩු බහුතර ඡන්දයෙන්, පහත දැක්වෙන සියලු කාරණා සඳහා හෝ ඉන් කිසිවක් සඳහා මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනනුකූල නොවන රීති සෑදීම නීත්‍යානුකූල වන්නේ ය:—

(අ) සාමාජිකයන් වර්ග කිරීම, සාමාජිකයන් විසින් ගෙවිය යුතු සාමාජික ගාස්තු, ඔවුන් ඇතුළත් කර ගැනීම, අස්කිරීම, නෙරපීම හෝ ඉල්ලා අස්වීම ;

(ආ) සංස්ථාවේ සහ අධ්‍යක්ෂ මණ්ඩලයේ රැස්වීම් කැඳවීම හා පැවැත්වීම සම්බන්ධයෙන් අනුගමනය කළ යුතු කාර්ය පරිපාටිය, එකී රැස්වීම්වල ගණපූරණය ද, ඔවුන්ගේ බලතල හා කාර්යයන් ක්‍රියාත්මක කිරීම හා ඉටු කිරීම ;

(ඇ) සංස්ථාවේ විවිධ නිලධරයන්ගේ, අනුයෝජිතයන් සහ සේවකයන් පත් කිරීම, ඔවුන්ගේ බලතල, කාර්ය සහ කර්තව්‍ය ;

(ඈ) සංස්ථාවේ සාමාජිකයකු වීමට හෝ අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයකු වීමට සපුරාලිය යුතු සුදුසුකම් ;

(ඉ) අධ්‍යක්ෂ මණ්ඩලය තෝරා පත් කර ගැනීම ; සහ

(ඊ) සංස්ථාවේ දේපළ පරිපාලනය කිරීම සහ කළමනාකරණය කිරීම.

(2) සංස්ථාව විසින් සාදනු ලැබූ යම් රීතියක් (1) වන උපවගන්තිය යටතේ රීතියක් සාදනු ලැබූ ආකාරයෙන් එවැනිම රැස්වීමක දී සංශෝධනය කිරීම, වෙනස් කිරීම හෝ ඒවාට යමක් එකතු කිරීම හෝ ඒවා පරිච්ඡින්න කිරීම කරනු ලැබිය හැක්කේ ය.

(3) සංස්ථාවේ සාමාජිකයන් සංස්ථාවේ රීතිවලට යටත් විය යුතු ය.

සංස්ථාව විසින් ගෙවිය යුතු සහ සංස්ථාවට අයවිය යුතු ණය.

**7.** මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භවන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී පැවැති පදනම විසින් ගෙවිය යුතු සියළු ණය සහ බැරකම් මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාව විසින් ගෙවිය යුතු අතර, එදිනට පදනමට අයවිය යුතු සියළු ණය සහ ගෙවිය යුතු සම්මාදම් මුදල් හෝ දායක මුදල් මේ පනතේ කාර්යය සඳහා සංස්ථාවට ගෙවනු ලැබිය යුතු ය.

සංස්ථාවේ අරමුදල.

**8.** (1) සංස්ථාවට එහිම අරමුදලක් තිබිය යුතු අතර, සංස්ථාව සඳහා සහ වෙනුවෙන් මෙතෙක් භාරගන්නා ලද හෝ මින්මතු භාරගනු ලබන ත්‍යාග, රික්තවරණ, පරිත්‍යාග, දායක මුදල්, ගාස්තු හෝ ප්‍රදාන වශයෙන් වූ මුදල් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තීරණය කරනු ලබන පරිදි සංස්ථාවේ නමින් එක බැංකුවක හෝ බැංකු කීපයක තැන්පත් කළ යුතු ය.

(2) මෙම පනත යටතේ සංස්ථාවේ බලතල ක්‍රියාත්මක කිරීමේදී සහ ඉටුකිරීමේ දී හා කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේදී සංස්ථාව විසින් දරනු ලබන වියදම් පියවීමට අවශ්‍ය සියළු මුදල්, සංස්ථාවේ අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

සංස්ථාව විසින් චංචල සහ නිශ්චල දේපළ දැරිය හැකි බව.

**9.** යම් මිලට ගැනීමක්, ප්‍රදානයක්, තෑගි කිරීමක්, කිසියම් ගිවිසුමක් නීයාදනයක් හෝ අන්‍යාකාරයකින් පදනම සතුවන යම් චංචල හෝ නිශ්චල දේපළක් අත් කර ගැනීමට හා දැරීමට නීතියෙහි ලා හැකියාව සහ බලය ඇති අතර, එවැනි සියලු දේපළ විකිණීමේ, බදු දීමේ, හුවමාරු කිරීමේ හෝ අන්‍යාකාරයකින් නීයාදනය කිරීමේ පූර්ණ බලය ඇතිව 7 වන වගන්තිය යටතේ සාදන ලද පදනමේ රීතිවලට යටත්ව මේ පනතේ කාර්යය සඳහා ඒ සියලු දේපළ පදනම විසින් දැරිය යුතු ය.

*සාමාජිකයන්ගේ වගකීම සීමා කිරීම.*

**10.** සංස්ථාවේ කිසිම සාමාජිකයකු සංස්ථාවේ ණය සහ බැරකම් ගෙවා සමථයට පත් කිරීමේ කාර්යය සඳහා ඔහුගෙන් සංස්ථාවට අයවිය යුතු සාමාජික මුදල් ප්‍රමාණය ඉක්මවන යම් දායක මුදලක් ගෙවීමට යටත් නොවන්නේ ය.

*විසුරුවා හැරීමේ දී ඉතිරිවන දේපළ.*

**11.** සංස්ථාව විසුරුවා හැරීමේ දී, එහි සියලු ණය සහ බැරකම් පියවීමෙන් පසුව කවර හෝ දේපළක් ඉතිරි වුවහොත්, ඒ දේපළ සංස්ථාවේ සාමාජිකයන් අතර බෙදනු නොලැබිය යුතු අතර, ඒවා සංස්ථාවේ පරමාර්ථවලට සමාන පරමාර්ථ ඇත්තා වූ ද ස්වකීය රීති අනුව යම් ආදායමක් හෝ දේපළක් ස්වකීය සාමාජිකයන් අතර බෙදීම තහනම් කර ඇත්තා වූ ද, වෙනත් යම් ආයතනයකට හෝ ආයතනවලට ඒ දේපළ දීම හෝ පැවරීම කරනු ලැබිය යුතු ය. සංස්ථාව විසුරුවා හරිනු ලබන අවස්ථාවේ දී හෝ ඊට පෙරාතුව ම, සංස්ථාවේ සාමාජිකයන් විසින් එම ආයතනය හෝ ආයතන තීරණය කරනු ලැබිය යුතු ය.

*ගිණුම් සහ විගණනය.*

**12.** (1) සංස්ථාවට ලැබුණු සහ සංස්ථාව විසින් වැය කරන ලද සංස්ථාවේ සියලු මුදල් පිළිබඳව ගිණුම් නිසි අයුරින් තැබීමට සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සැලැස්විය යුතු ය.

(2) සංස්ථාවේ මුදල් වර්ෂය ලිත් වර්ෂය විය යුතු ය.

(3) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පත් කරන ලද විගණකවරයකු හෝ විගණකවරයන් විසින් සෑම වර්ෂයකදීම යටත් පිරිසෙයින් එක් වරක් ගිණුම් පරීක්ෂා කොට විගණනය කරගත යුතු ය.

*සංස්ථාවේ මුද්‍රාව.*

**13.** සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ එක් සාමාජිකයකු ඉදිරිපිට දී මිස සංස්ථාවේ මුද්‍රාව කිසිදු සාධන පත්‍රයකට නොතැබිය යුතු ය. පැමිණ සිටි බවට සලකුණක් වශයෙන් ඔවුන් විසින් එකී සාධන පත්‍රයේ තම නම් ලියා අත්සන් කළ යුතු අතර, ඒ අත්සන් කිරීම සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකු විසින් අත්සන් කිරීමට පරිබාහිරව විය යුතු ය.

**14.** ජනරජයේ හෝ යම් රාජ්‍ය මණ්ඩලයක හෝ සංස්ථාවක හෝ අයිතිවාසිකම්වලට මේ පනතේ ඇතුළත් කිසිවකින් හානියක් හෝ බලපෑමක් නොවන්නේ ය.

ජනරජයේ සහ අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.

**15.** මෙම පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර කිසියම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.